# 7 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කියවීම් ද්‍රව්‍ය




## ඒකකය 2

## මෙහෙයුම් පද්ධති




## ගොනු හා ගොනු බහාලුම්වල ගුණාංග

ජේ.එස්.ප්‍රියදර්ශනී මිය

බ/වැලිකේමුල්ල ම.වි., බදුල්ල.

# ගොනුවක හා ගොනු බහාලුමක ගුණාංග

පරිගණකයේ අපට දක්නට ලැබෙන ගොනු (Files) හා ගොනු බහාලුම්(Folders) විවිධාකාරය. ඒවායේ වර්ගය, ප්‍රමාණය අනුව විවිධ ගුණාංග පවතී. මෙම ගුණාංග පිළිබඳ දැන සිටීම ඇතැම් අවස්ථාවලදී අපට ප්‍රයෝජනවත් වේ.

යම් ගොනුවක්/ ගොනු බහාලුමක් මතට මූසිකයේ දක්වනය(mouse pointer) ගෙන ගොස් දකුණු මූසික බොත්තම එබූ පසුව, ලැබෙන මෙනුවේ අවසානයට ඇති Properties මගින් එහි ගුණාංග බලා ගත හැකි වේ.

මෙම ගුණාංග පහත ආකාර වේ.

## ගොනුවේ වර්ගය

ගොනුවක වර්ගය අනුව එය විවෘත කළ හැකි මෘදුකාංග විවිධාකාර වේ.

- ලේඛන වර්ගයේ ගොනු
  .docx (Microsoft Word මගින් විවෘත කර සංස්කරණය කළ හැක.)
- ශ්‍රව්‍ය වර්ගයේ ගොනු
  .mp3, .mav, .aif, .wma, (ගීත, වාද්‍ය ඛණ්ඩ, විවිධ නාද ආදිය)
- වීඩියෝ වර්ගයේ ගොනු
  .mp4, .flv, .mpeg, .mpg, .avi
- පින්තූර වර්ගයේ ගොනු
  .png, .jpeg, .tiff, .gif,

# ගොනුවක ප්‍රමාණය

සෑම ගොනුවකම ප්‍රමාණයක් ඇත. ඇතැම් ගොනු kb වැනි කුඩා ධාරිතාවයෙන් යුක්ත වන අතර ඇතැම් ගොනු වල ධාරිතාවය GB, TB වැනි ප්‍රමාණවලින් ද පවතී. මෙහි ප්‍රමාණය අනුව එයට ගබඩා කර තබා ගැනීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය තීරණය වේ.

# දිනය

ගොනුවක් නිර්මාණය කළ දිනය, අවසාන වරට සකස් කිරීමක් කළ දිනය හා අවසාන වරට විවෘත කළ දිනය ආදිය ද අපට දැන ගත හැකිය.

| | |
|---|---|
| Created: | Friday, October 22, 2021, 10:22:36 PM |
| Modified: | Friday, July 23, 2021, 7:21:03 PM |
| Accessed: | Friday, October 22, 2021, 10:22:36 PM |

ගොනු විශාල ප්‍රමාණයක් දක්නට ලැබෙන අවස්ථාවකදී අපට අවශ්‍ය ගොනු ඉක්මනින් සොයා ගැනීමේ පහසුව සඳහා ගොනුවේ නම, ගොනුව සැකසූ දිනය ආදී ගුණාංග අනුව අනුලෝම ප්‍රතිලෝම පිළිවෙලට ගොනු පෙළ ගැස්වීමට ද හැකිය.

Group by




Sort by




ගොනු තිබෙන ගොනු බහාලුම හෝ ස්ථානය විවෘත කළ විට ලැබෙන කවුලුවේ මැද දක්වනය(mouse pointer) තබා මූසිකයේ දකුණු බොත්තම එබූ විට මෙම මෙනු දෙක බලා ගත හැකිය.

මෙහිදී අපට ගොනුවේ නම, නවීකරණය කළ දිනය, ගොනු වර්ගය හා ගොනුවේ ප්‍රමාණය අනුව පෙළ ගැස්විය හැකිය.

## ගොනුවල ගුණාංග ප්‍රයෝජනවත් වන අවස්ථා

- යම් ගොනුවක ගබඩා කර ඇති ස්ථානය සොයා ගැනීමට
- ගොනුවක ප්‍රමාණය සොයා ගැනීමට
- ගොනුවක් විවෘත කිරීමට හැකි මෘදුකාංග වර්ගය සොයා ගැනීමට
- ගොනුවක් විවෘත කරන මෘදුකාංගය වෙනස් කිරීමට